# “නිරවුල් මනසක් – සුපිරිසිදු ශ්‍රී ලංකාවක්”

විවෘත කෙටි වීඩියෝ තරගය — නිල මාර්ගෝපදේශ

## 1. තරගයේ අරමුණ

“නිරවුල් මනසක් – සුපිරිසිදු ශ්‍රී ලංකාවක්”— මෙම තේමාව යටතේ නිරවුල් හා යහපත් සිතුවිලි, පිරිසිදු පරිසරය, සමාජ වගකීම, යහපත් පුරුදු සහ පිරිසිදු ශ්‍රී ලංකාවක් ගොඩනැගීම වැනි කරුණු නිර්මාණශීලී කෙටි වීඩියෝ මගින් ඉදිරිපත් කිරීමට ඌව පළාතේ තරුණ තරුණියන්ට හා පොදු ජනතාවට අවස්ථාවක් ලබා දීම.

## 2. සහභාගී විය හැක්කේ කාටද

- ඌව පළාතේ ජීවත් වන ඕනෑම පුරවැසියෙකුට. වෘත්තීය පළපුරුද්ද අවශ්‍ය නැත.
- වයස් කාණ්ඩ: අවු 18 වැඩි විය යුතුය.
- තනි පුද්ගල හෝ කණ්ඩායම් ඉදිරිපත් කිරීම් පිළිගැනේ. කණ්ඩායමක් නම් සම්බන්ධීකාරක එක් අයෙකු නම් කළ යුතුය.
- එක් තරගකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- සංවිධායක කමිටුවේ සාමාජිකයන්, විනිසුරු මණ්ඩලය සහ ඔවුන්ගේ ආසන්න ඥාතීන් සුදුසුකම් නොලබයි.

## 3. තේමාව හා යෝජිත අනු තේමා

ප්‍රධාන තේමාව: නිරවුල් මනසක් – සුපිරිසිදු ශ්‍රී ලංකාවක්

*පහත අනු තේමා අනිවාර්ය නොවේ — මඟ පෙන්වීමක් පමණි.*

✓ නිරවුල් මනස – යහපත් ජීවිතයක ආරම්භය

මානසික සුවය, යහපත් සිතුවිලි, ආතතිය කළමනාකරණය සහ එකිනෙකාට කරුණාව දැක්වීම පිළිබඳ නිර්මාණ.

✓ පිරිසිදු පරිසරය – අපේ වගකීම

කැළි කසළ නිසි ලෙස බැහැර කිරීම, ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ වීඩියෝ.

✓ පිරිසිදු සමාජයක් – යහපත් මිනිසුන්ගෙන්

අවංකකම, වගකීම, අන්‍යෝන්‍ය ගෞරවය, සහයෝගය හා සමාජ වටිනාකම් තුළින් පිරිසිදු සමාජයක් ගොඩනැගීම.

✓ අද පුරුද්ද – හෙට පිරිසිදු ශ්‍රී ලංකාවක්

දෛනික ජීවිතයේ කුඩා යහපත් පුරුදු—කසළ වෙන් කිරීම, නැවත භාවිතය, සම්පත් සුරැකීම සහ පිරිසිදුකම— මගින් රටට සිදුවන බලපෑම.

✓ මගේ ගමෙන් පිරිසිදු ශ්‍රී ලංකාවකට

තම ගම, පාසල, කාර්යාලය හෝ ප්‍රජාව පිරිසිදු කිරීම හා නිරවුල්, වගකීම් සහගත සමාජයක් ගොඩනැගීමට තරුණයන් හා ජනතාවගේ දායකත්වය

## 4. තාක්ෂණික නිර්ණායක

| අංගය | නිර්ණායකය |
|---|---|
| දිග | විනාඩි 3 – 10 (ශීර්ෂ හා නාමාවලිය ඇතුළුව) |
| ගොනු ආකෘතිය | MP4 (H.264) |
| විභේදනය | අවම 1080p (1920×1080) |
| රාමු අනුපාතය | තිරස් 16:9 (සිරස් 9:16 ද පිළිගැනේ — එකක් තෝරන්න) |

| අංගය | නිර්ණායකය |
|---|---|
| ශබ්දය | පැහැදිලි, පසුබිම් ඝෝෂාවෙන් තොර |
| භාෂාව | සිංහල / දෙමළ / ඉංග්‍රීසි |
| උපසිරැසි | සිංහල හෝ දෙමළ නම් ඉංග්‍රීසි උපසිරැසි අනිවාර්යයි |
| ගොනු ප්‍රමාණය | උපරිම 500MB |

ජංගම දුරකථනයකින් රූගත කළ නිර්මාණ ද සම්පූර්ණයෙන්ම පිළිගැනේ. උපකරණවල මිල ගණන් ඇගයීමට බලපාන්නේ නැත.

## 5. නිර්මාණ නීති

1. නව නිර්මාණයක් විය යුතු අතර කිසිදු මාධ්‍යයක ප්‍රචාරණය නොවූ එකක් විය යුතුය (විද්‍යුත් හා ඩිජිටල්)
2. වෙනත් තරගයකදී ත්‍යාග ලබා ඇති නිර්මාණ පිළිගනු නොලැබේ.
3. ප්‍රකාශන හිමිකම්: භාවිත කරන සියලු සංගීතය, රූප සහ දෘශ්‍ය ද්‍රව්‍ය තමන්ගේම විය යුතුය, නැතහොත් ලිඛිත අවසරය / royalty-free / Creative Commons බලපත්‍රයක් සහිත විය යුතුය. මූලාශ්‍ර ලැයිස්තුවක් ඉදිරිපත් කිරීම අනිවාර්යයි.
4. වීඩියෝවේ පෙනී සිටින පුද්ගලයන්ගෙන් ලිඛිත අවසර ලබාගත යුතුය; ළමයින් නම් භාරකරුගෙන්.
5. කෘත්‍රිම බුද්ධිය: AI මෙවලම් භාවිත කර ඇත්නම් ඉදිරිපත් කිරීමේ පෝරමයේ ප්‍රකාශ කළ යුතුය. **සම්පූර්ණයෙන්ම AI මගින් ජනනය කළ නිර්මාණ පිළිගනු නොලැබේ.**
6. ජාතිවාදී, ආගම්වාදී හෝ වෛරී ප්‍රකාශ; පක්ෂ දේශපාලන ප්‍රචාරය; වෙළඳ දැන්වීම්; ප්‍රචණ්ඩත්වය හෝ අසභ්‍ය දර්ශන; පුද්ගල අපහාස; සනාථ නොකළ තොරතුරු. වීඩියෝවේ කිසිදු අයුරකින් ඇතුලත් නොවිය යුතුය.

## 6. ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය

- වීඩියෝව YouTube (unlisted) වෙත උඩුගත කර සබැඳිය [ඉදිරිපත් කිරීමේ පෝරමයේ සබැඳිය] හරහා යොමු කරන්න.
- ගොනු නම: සම්පූර්ණනම_වීඩියෝමාතෘකාව_වයස්කාණ්ඩය
- පෝරමය සමඟ ඉදිරිපත් කළ යුතු දෑ: නම, ජා.හැ. අංකය, දුරකථන අංකය, විද්‍යුත් ලිපිනය, වීඩියෝ මාතෘකාව, වචන 100ක සාරාංශයක්, මූලාශ්‍ර ලැයිස්තුව, අත්සන් කළ ප්‍රකාශනය.
- අවසන් දිනය: **2026.09.08 ප.ව. 11.59**
- ලැබීම තහවුරු කරමින් විද්‍යුත් තැපැලක් යවනු ලැබේ. පැය 48ක් තුළ ලැබුණේ නැත්නම් අප හා සම්බන්ධ වන්න.

## 7. ඇගයීම් නිර්ණායක (ලකුණු 100)

| නිර්ණායකය | ලකුණු |
|---|---|
| තේමාවට අදාළත්වය හා පණිවිඩයේ පැහැදිලිකම | 30 |
| නිර්මාණශීලීත්වය හා මුල් බව | 25 |
| කථා රටාව හා ගලා යාම | 20 |

| නිර්ණායකය | ලකුණු |
|---|---|
| තාක්ෂණික ගුණාත්මකභාවය (රූගත කිරීම, සංස්කරණය, ශබ්දය) | 15 |
| සමස්ත බලපෑම හා ප්‍රේක්ෂක ආකර්ෂණය | 10 |

## 8. විනිශ්චය හා ප්‍රතිඵල

- චිත්‍රපට, මාධ්‍ය හා නිර්මාණ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත ස්වාධීන විනිසුරු මණ්ඩලයක්.
- පූර්ව තේරීම් ලැයිස්තුව ප්‍රකාශයට පත් කෙරේ.
- අවසන් ප්‍රතිඵල මොණරාගල ඌව නවෝදය වැඩසටහන් පරිශ්‍රයේදී ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වේ.
- විනිසුරු මණ්ඩලයේ තීරණය අවසාන වන අතර ඒ පිළිබඳ ලිපි හුවමාරුවක් සිදු නොකෙරේ.

## 9. ත්‍යාග

| ස්ථානය | ත්‍යාගය |
|---|---|
| පළමු ස්ථානය | රු. 25000.00 + සහතිකය |
| දෙවන ස්ථානය | රු. 20000.00 + සහතිකය |
| තෙවන ස්ථානය | රු. 15000.00 + සහතිකය |
| කුසලතා ත්‍යාග (10) | රු. 5000.00 + සහතිකය |

සහභාගී වූ සියලු දෙනාට ඩිජිටල් සහභාගිත්ව සහතික ලබා දෙනු ලැබේ.

## 10. හිමිකම් හා භාවිත අයිතිය

- නිර්මාණයේ ප්‍රකාශන හිමිකම නිර්මාණකරුට හිමිය.
- ඉදිරිපත් කිරීමෙන්, සංවිධායකයින්ට එම නිර්මාණය ප්‍රචාරණ, අධ්‍යාපනික හා ප්‍රදර්ශන කටයුතු සඳහා නොමිලේ, කල් නොබැඳි ලෙස භාවිත කිරීමේ විශේෂිත නොවන (non-exclusive) අයිතිය හිමි වේ. සෑම භාවිතයකදීම නිර්මාණකරුගේ නම සඳහන් කෙරේ.

## 11. අයෝග්‍යතාවය

වැරදි තොරතුරු සැපයීම, ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය, තහනම් අන්තර්ගතය හෝ මෙම නීති කඩ කිරීම හේතුවෙන් ඕනෑම අවස්ථාවක — ත්‍යාග ප්‍රදානයෙන් පසුව වුව ද — ඉදිරිපත් කිරීම ඉවත් කිරීමට හා ත්‍යාග ආපසු ලබා ගැනීමට සංවිධායකයින්ට අයිතිය ඇත.

## 12. විමසීම්

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
055-2228525, 0705260360